www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සර්දාරිගේ සංචාරය පකිස්තාන-චීන සබඳතා ශක්තිමත් කරයි

## Zardari's visit strengthens Pakistan-China relations

විලානි පීරිස් විසිනි

2010 ජුලි 22

ජුලි 6 දායින් ඇරඹුනු, පකිස්තාන ජනාධිපති අසිෆ් අලි සර්දාරිගේ පස් දින චීන සංචාරයේ අරමුන වූයේ දෙරට අතර ආර්ථික හා මූලෝපායික සබඳතා ශක්තිමත් කිරීමයි. සර්දාරි චීන ජනාධිපති හු ජින්ටාඕ හා අගමැති වෙන් ජියාබාඕ සහ තවත් වැදගත් දේශපාලනික හා ව්‍යාපාරික නායකයන් ගනනාවක් හමුවිය. 2008 දී රටේ ජනාධිපති ලෙස ඔහු පත්වීමෙන් පසුව කල නිල සංචාර දෙක ද ඇතුලුව, මෙය සර්දාරිගේ පස්වන චීන සංචාරය විය.

ගැඹුරු ආර්ථික හා දේශපාලනික අර්බුදයකින් වටලන ලදුව සහ ඉන්දියාව සමග ආතතීන් අඛන්ඩව පවතින තතු තුල, ඉස්ලාමාබාද් පාලනය චීනය සලකන්නේ වැදගත් සගයකු ලෙසයි. එලෙසම, එක්සත් ජනපදය හා ඉන්දියාව සමග පවත්නා බල තරගය ඇතුලු වැඩෙන ජාත්‍යන්තර බල තරගයේ සන්දර්භය තුල, බෙයිජිං පාලනය ඉස්ලාමාබාද් සමග සිය සබඳතාව වඩා ශක්තිමත් කර ගැනීමට උත්සාහ කරයි.

හු මෙසේ සඳහන් කලේයඃ "චීනය වනාහි පකිස්තානයේ ස්ථාවරත්වය හා ආර්ථික ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීමට කැප වූ මිතුරෙක් හා මූලෝපායික හවුල්කරුවෙකි."

සර්දාරි චීන නායකයන් සමග පුලුල් පරාසයක කලාපීය හා ජාත්‍යන්තර ප්‍රශ්න සාකච්ඡා කල බව මාධ්‍ය වාර්තා මගින් දැක්වුනි. පකිස්තානයට වාසි සහගත ආයෝජන හා වෙලඳ ගිවිසුම් ගනනාවකට ම සර්දාරිගේ සංචාරය තුල දී අත්සන් තැබුනි. කෙසේවෙතත්, බල ශක්ති පිපාසයෙන් පෙලෙන පකිස්තානය තුල චීනය විසින් නව න්‍යෂ්ටික ප්‍රතිකාරක දෙකක් ගොඩනගනු ලැබීමේ සැලසුම් පිලිබඳව සර්දාරි හා චීනය නායකයන් සාකච්ඡා කලේ ද නැද්ද යන වග කිසිදු සඳහනක් නැත. මෙම කාරනය පිලිබඳව මහ බලවතුන්ගේ, විශේෂයෙන් ම එක්සත් ජනපදයේ හා ඉන්දියාවේ උත්සුකතා මතුව තිබේ.

පසුගිය වසර කිහිපය තුල දී, දෙරට අතර වෙලඳම සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබේ. 2002 දී ඩොලර් බිලියන 2ක් වූ ද්විපාර්ශ්වීය වෙලඳම පසුගිය වසරේ දී ඩොලර් බිලියන 7 දක්වා වැඩී තිබුනි. චීනයේ පකිස්තාන තානාපති මසූද් ඛාන්ට අනුව, දැන් වසයෙන් චීන ව්‍යවසායන් 120ක් පකිස්තානය තුල වැඩ කරයි. චීනය පකිස්තානයේ විදුලි සංදේශ, බල ශක්ති, යටිතල පහසුකම්, බැර ඉංජිනේරු, තොරතුරු තාක්ෂන, පතල් හා ආරක්ෂක කර්මාන්ත තුල ආයෝජනය කර තිබේ.

අත්සන් කෙරුනු නව ගිවිසුම්වලට ජලවිදුලි වේලි ගොඩනැගීම, දෙමුහුම් බීජ තාක්ෂනය ලබාදීම, බැංකු කටයුතු පුලුල් කිරීම, මංමාවත් හා පනිවුඩ හුවමාරු ජාල ද වාර්මාර්ග ජලය වඩාත්ම කාර්යක්ෂම ලෙස භාවිත කිරීම හා තිරිඟුවල හා කපුවල ඉහල අස්වැන්න ලබාදෙන නව බීජ වර්ග වර්ධනය මත අවධානය යොමු කරමින් කෘෂිකර්මාන්තය තුල සහයෝගිතාව ද ඇතුලත් වේ. නව ව්‍යාපෘති සඳහා ආධාර ලෙස පකිස්තානයට යුආන් මිලියන 50ක් (එ.ජ. ඩොලර් මිලියන 7.4) ලබා දීමට ද චීනය පොරොන්දු විය.

ඉස්ලාමාබාද්හි දී පකිස්තාන-චීන ඒකාබද්ධ ආර්ථික සංසදයේ රැස්වීමක් කැඳවීමට ද එකඟ විය. එහි දී චීනයේ වානිජ ඇමති චෙන් ඩෙමිං බෙයිජිං නියෝජිත මන්ඩලයට නායකත්වය දීමට ද නියමිතය. එම සංසදය විනිමය හුවමාරු, පකිස්තානය තුල චීන බැංකු ශාඛා විවෘත කිරීම සහ පකිස්තානයේ විශේෂ කාර්මික කලාප තුල කම්හල් ප්‍රතිස්ථානගත කිරීම පිලිබඳව සාකච්ඡා කරනු ඇත.

චීනය බලුකිස්තාන් පලාතේ ග්වඩාර් වරාය ඉදිකිරීම සඳහා ද මුදල් යොදවයි. මෙය වනාහි, එක්සත් ජනපද විශ්ලේෂකයන් විසින් "මුතු වැල" යන නම පටබඳින ලද නාවික මධ්‍යස්ථාන -- හොං කොං සිට පෝර්ට් ඔෆ් සුඩාන් දක්වා දිවෙන ඉන්දියානු සාගරයේ මුහුදු මාර්ග ඔස්සේ ඉදිකෙරෙන වරායන් මාලාවක් -- ගොඩනැගීමේ මූලෝපායික සැලසුමක කොටසකි.

පකිස්තානයේ මෙන් ම, මියන්මාර් (බුරුමය), බංග්ලාදේශය සහ ශ්‍රී ලංකාව යන රටවල ද වරායන් ඉදිකිරීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ බෙයිජිං යෙදී සිටී.

කුන්ජෙරාබ් දූර්ගය හරහා චීනය හා පකිස්තානය සම්බන්ධ කරන කරාකොරාම් මහා මාර්ගය වැඩිදියුනු කිරීම සහ ජාතික වෙලඳ කොරිඩෝව (එන්ටීසී) පිලිබඳ ව්‍යාපෘතියේ ප්‍රගතිය ගැන ද සාකච්ඡා කෙරුනි. එන්ටීසී යටතේ, ප්‍රවාහන සබඳතා, විශේෂයෙන්ම මධ්‍යම ආසියානු රාජ්‍ය හා චීනය සමග ප්‍රවාහන සබඳතා, ශක්තිමත් කරනු පිනිස, කරාකොරාම් මහා මාර්ගය ද ග්වඩාර් වරාය සමග සම්බන්ධතා මාර්ග ද ඇතුලු, කිලෝ මීටර් 4,000ක නවීන මහා මාර්ග ජාලයක් ඉදිකෙරෙනු ඇත.

එහි එල්ලය වන්නේ, මැද පෙරදිග, මධ්‍යම ආසියාව, දකුනු ආසියාව හා චීනය අතර නව වෙලඳ මාර්ගයක සන්ධිස්ථානයක් ලෙස යොදාගනු පිනිස පකිස්තානයේ භූ-මූලෝපායික පිහිටීම ගසාකෑමයි.

ලෝක බලයක් ලෙස මතුවීමටත් එක්සත් ජනපදයට ප්‍රතිමුඛ කිරීමටත් තීරනාත්මක වන ප්‍රදේශයක් ලෙස බෙයිජිං විසින් මෙම කලාපය සලකන ලබන තතු යටතේ, ග්වඩාර් වරාය සහ එන්ටීසී වැනි සැලසුම්වලට පුලුල් ගෝලීය අර්ථභාරයක් පවතී. මධ්‍යම ආසියාව සහ ඉන්දියානු සාගරය චීන බල ශක්ති සැපයුම් හා චීන නිෂ්පාදන අපනයනය සඳහා තීරනාත්මක වන අතරමැදි කලාපයන් ය. එනයින් ගත් කල, කලාපය තුල චීනයේ රාජ්‍යතාන්ත්‍රික හා මිලිටරි ආනුභාවය වැඩි කර ගැනීමේ ප්‍රයත්නය, මේ අවස්ථාවේ කලාපයේ ප්‍රමුඛ මිලිටරි බලය ලෙස පවතින එක්සත් ජනපදයෙන් එල්ල වන දේශපාලන බලපෑමට ප්‍රතිරෝධය දැක්වීම පිනිස තීරනාත්මක වේ.

එවන් සැලසුම් ඉන්දියාව සමග පවත්නා ආතතීන් ද උත්සන්න කරයි. මූලෝපායික කරාකොරාම් කඳුවැටිය හරහා දුම්රිය මාවතක් ඉදිකිරීමට සැලසුම් කරන චීනය, චීන දේශසීමාවට ආසන්නයෙන් පිහිටි, පකිස්තාන පාලනය යටතේ පවතින කාශ්මීරයේ මතභේදයට ලක්ව ඇති ගිල්ගිට්-බල්තිස්තාන් කලාපයේ මහා මාර්ග දෙකක් ඉදිකිරීමේ තවත් ගිවිසුමක් පිලිබඳව ද සාකච්ඡා කර තිබේ. මෙම යෝජිත දුම්රිය මාර්ගය පිලිබඳ සිය උත්සුකතා ඉන්දියාව මේ වන විටත් ප්‍රකාශ කර ඇත. "සිදු වන්නේ කුමක්ද යන්න අපි සමීපව බලාසිටින" බව විදේශ ඇමති එස්.එම්. ක්‍රිෂ්නා නව දිල්ලියේ දී පැවසුවේ යයි ඉකොනොමික් ටයිම්ස් ජුලි 9 දා වාර්තා කලේය.

කෙසේවෙතත්, පකිස්තානයට නම්, කලාපයේ සිය ඓතිහාසික සගයා වන චීනය සමග ඇති කර ගන්නා සහයෝගිතාව, මූලික ආර්ථික ප්‍රතිලාභ පිලිබඳ බලාපොරොත්තුව දල්වයි.

චීන ජාතික බල ශක්ති පාලනාධිකාරය පකිස්තානයේ බල ශක්ති සැපයුම වර්ධනය කරනු වස් පකිස්තාන අධිකාරීන් සමග වැඩ කිරීමට ඉලක්ක කරගෙන සිටී. මෙගාවොට් 16,500ක් වන එරට විදුලි බල ධාරිතාවට සාපේක්ෂව එය මුහුන දෙන මෙගාවොට් 4,000-5,000ක දැවැන්ත විදුලි බල හිඟය මගින් පකිස්තානයේ දරුනු ආර්ථික අර්බුදය උත්සන්න කෙරී ඇත. මෙය, නිෂ්පාදනය සඳහා ප්‍රමානවත් තරම් විදුලි බලය සැපයීමෙහි ලා අපොහොසත් වන කාර්මික අංශය, විශේෂයෙන් ම රෙදිපිලි කර්මාන්තය, අඩපන කර තිබේ. මෙම තතු විදුලි බල සැපයුම් කප්පාදු සඳහා තුඩු දී ඇත්තේ, ව්‍යාපාරික ආයතන හා පුද්ගලික නිවාස යන දෙපාර්ශ්වයම මත බලපාමිනි. උනුසුම් ග්‍රීෂ්ම මාසවල දී එම බලපෑම වඩාත් උත්සන්න වේ.

දිනකට පැය 8 සිට 12 දක්වා වන විදුලි බල කප්පාදු සාමාන්‍යය බවට පත්ව තිබේ. එමෙන්ම කලින් නොදන්වා කෙරෙන විදුලි බල කප්පාදු සංඛ්‍යාව ද වැඩෙමින් පවතී. ඒ පිලිබඳව නැගෙන මහජන වෛරය, මහා මාර්ග අවහිර කරමින් හා ටයර් පුලුස්සමින් රට පුරා කෙරෙන විරෝධතාවන්ට නිරන්තරව ම තුඩු දෙයි. මෙවන් විරෝධතාවල දී පොලීසිය සමග ගැටුම් ඇතිවීම වඩවඩා නිරන්තර සිදුවීමක් බවට පත්වෙමින් තිබේ.

එක්සත් ජනපදයේ හා ඉන්දියාවේ උත්සුකතාවන්ට ප්‍රධාන හේතුවක් වූයේ, පකිස්තානයේ පංජාබ් පලාතේ මෙගාවොට් 650ක න්‍යෂ්ටික ප්‍රතිකාරක දෙකක් අලුතෙන් ඉදිකිරීමට තමන් කටයුතු කරන බවට, සර්දාරිගේ සංචාරයේ මුව විට දී, චීනය කල ප්‍රකාශයයි. සර්දාරිගේ මෑත සංචාරයේ දී එම කාරනාව ගැන සාකච්ඡා කලේ ද නැද්ද යන වග මාධ්‍යවලට වාර්තා නොවුනි. එම කාරනාවට එතරම් ප්‍රසිද්ධියක් ලබා නොදීමට ප්‍රධාන හේතුව වූයේ එක්සත් ජනපදය, ඉන්දියාව හා න්‍යෂ්ටික සැපයුම්කරුවන්ගේ කන්ඩායම (එන්එස්ජී) එයට දක්වන විරුද්ධත්වයයි.

පකිස්තානය න්‍යෂ්ටික අවි වර්ධනය කර තිබීම සහ න්‍යෂ්ටික අවි තව දුර වර්ධනය වැලැක්වීමේ ගිවිසුමට (එන්පීටී) අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීම නිසා මෙම ව්‍යාපෘතිය මතභේදයට තුඩු දී තිබේ. එන්පීටී අත්සන් කර නැති කිසිදු රටකට න්‍යෂ්ටික තාක්ෂනය හෝ ඉන්ධන සැපයීම, චීනය ද ඇතුලත් රටවල් 46කින් සමන්විත න්‍යෂ්ටික සැපයුම්කරුවන්ගේ කන්ඩායමට තහනම් ය.

එහෙත් චීනය එම විරෝධතා නොතකයි. සංචාරය මුවවිට දී, එක්සත් ජනපදයේ චීන තානාපති කාර්යාලයේ ප්‍රකාශක වැං බඕඩොං මාධ්‍යවලට කියාසිටියේ, ව්‍යාපෘතිය, "ජාත්‍යන්තර න්‍යෂ්ටික අවි

තව දුර වර්ධනය වැලැක්වීමේ ගිවිසුම සම්බන්ධයෙන් චීනය හා පකිස්තානය බැඳී සිටින ජාත්‍යන්තර වගකීම් සමග මැනවින් ගැලපෙන" බවයි.

එක්සත් ජනපදය "පකිස්තානය සඳහා අලුතෙන් සිවිල් න්‍යෂ්ටික ප්‍රතිකාරක දෙකක් ඉදිකිරීමට මෙම වසර මුල දී එය ඇති කරගත් ගිවිසුම ගැන චීනයෙන් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටින" බව රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රකාශක පී.ජේ. ක්‍රව්ලි ජුලි 13 දා පැවසුවේ යයි *රොයිටර්* වාර්තා කලේය. ඔහු තව දුරටත් මෙසේ පැවසීයඃ "අප විශ්වාස කරන්නේ එවන් සහයෝගිතාවක් සඳහා න්‍යෂ්ටික සැපයුම්කරුවන්ගේ කන්ඩායමේ ඒකමතිකත්වයෙන් අනුමත කෙරුනු විශේෂ අවසරයක් අවශ්‍ය කෙරෙනු ඇත යන්නයි."

ජුලි 17 දා, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන්ගේ ඉස්ලාමාබාද් සංචාරයට පෙර දින, *වෝල් ස්ට්‍රීට් ජර්නල්* සඳහන් කලේ, ඇය "න්‍යෂ්ටික අවි තව දුර වර්ධනය වැලැක්වීමේ ඔබාමා ආන්ඩුවේ වඩා පුලුල් ව්‍යාපාරයට වල කපනු ඇතැයි එක්සත් ජනපද නිලධාරින් බිය වන ගිවිසුමක් වන යෝජිත න්‍යෂ්ටික උපකරන අලෙවිය පිලිබඳ කාරනය පකිස්තාන නිලධාරින් සමග" මතු කරනු ඇති බවයි.

අඩු ම ලංසුවෙන් කියතොත් මෙය කුහක පිලිවෙතකි. ඉන්දියාව සමග වොෂිංටනයේ න්‍යෂ්ටික ගිවිසුම අත්සන් කෙරුනේ ඉන්දියාව එන්පීටී ගිවිසුමට අත්සන් නොකර තිබීම නොතකා ය. එක්සත් ජනපදය ඉන්දියාව සමග ගිවිසුම අත්සන් කරනු පිනිස එන්එස්ජී වෙතින් විශේෂ ලිහිලක් උපුටා ගති. කෙසේවෙතත්, 2005 දී පකිස්තානය එවන් ගිවිසුමක් එක්සත් ජනපදයෙන් ඉල්ලා සිටි විට වොෂිංටනය එය ප්‍රතික්ෂේප කලේය.

සර්දාරි පකිස්තාන-චීන ආර්ථික සංසදය හමුවේ මෙසේ පැවසීයඃ "පකිස්තාන-චීන මිත්‍රත්වය කලාපයේ සාමය හා ස්ථාවරත්වය සඳහා වැදගත් සාධකයකි." සර්දාරි ද *නිව්ස්* වෙත මෙසේ කියා සිටියේයඃ "ඉන්දියාව ඇමරිකා එක්සත් ජනපදය සමග සිවිල් න්‍යෂ්ටික ගිවිසුම සඳහා ගිය විට, අපි එයට විරුද්ධ වුනේ නැහැ. ඒක නිසා, අපගේ මිතුරන්ට අනෙක් මිතුරන් මත ආනුභාවයක් තිබීම අපි ප්‍රශ්නයක් කර ගත්තෙ නැහැ."

ඉරානයට එරෙහි එක්සත් ජනපද යුද සූදානම නිසා තමන්ට මෙම ගිවිසුම ගැන සාකච්ඡා කල හැකි යයි බෙයිජිං සිතන බව, පකිස්තාන-චීන සබඳතා පිලිබඳ ඇමරිකානු විශේෂඥයකු වන ඇන්ඩෲ ස්මෝල්, විදේශ සබඳතා මන්ඩලය නම් වූ එක්සත් ජනපද චින්තන පර්ෂදයට පැවසීය. ඔහු මෙසේ කියා සිටියේයඃ "මේ අවස්ථාවේ ඉරානය වැනි කාරනා සම්බන්ධයෙන් වොෂිංටනයට බෙයිජිංහි සහයෝගය අවශ්‍යව ඇතැයි ද එය ගිවිසුමට බැරෑරුම් ප්‍රතිරෝධයක් මතු කිරීමට කැමැත්තක් නොදක්වනු ඇතැයි ද චීන්නු විශ්වාස කරති."

වත්මන් ගිවිසුම වනාහි, චීනය එන්එස්ජී සංවිධානයට එක් වූ 2004 වසරට බොහෝ පෙර එලඹුනු පොදු ගිවිසුම දීර්ඝ කිරීමක් බව ද එබැවින් එය එන්එස්ජීහි පාලනය යටතට නොවැටෙන බවත් චීනය තර්ක කරයි. චීන අවි පාලන හා අවිහරන සංගමයේ නියෝජ්‍ය මහ ලේකම් ශායි ඩෙක්වාන් ද *හින්දු* පත්‍රයට දුන් සම්මුඛ සාකච්ඡාවක දී මෙසේ පැවසීයඃ "එන්එස්ජී සම්බන්ධයෙන් ගත් කල, මෙය බොහෝ කලකට පෙර ඇති කර ගැනුනු පොදු ගිවිසුමකි. එක්සත් ජනපද නිදසුන පූර්වගාමියකු ලෙස ගත් කල, එය විශේෂ අවසරයක් පිලිබඳ තවත් අවස්ථාවක් විය හැකිය."

"න්‍යෂ්ටික සහයෝගිතාව සම්බන්ධයෙන් දෙබිඩි පිලිවෙතක්" අනුගමනය කරන්නේ යයි, ජුලි 19 දා පල කල කෙටි ලිපියකින්, සින්හුවා චීන ප්‍රවෘත්ති සේවය, එක්සත් ජනපදයට සහ චීන-පකිස්තාන න්‍යෂ්ටික සහයෝගිතාවට විරුද්ධ වන සෙසු රටවලට චෝදනා කලේය. කෙසේවෙතත්, චීන-පකිස්තාන "මූලෝපායික සහයෝගිතා ප්‍රයත්නයට වෙනත් තෙවන පාර්ශ්වයක් ඉලක්ක කර ගැනීමේ අභිප්‍රායක් නැති" බව එම ලිපිය කියාපෑවේය.

© www.wsws.org